# උපදෙස් පත්‍රිකාව

මෙම නිශ්කාෂන අයදුම්පත්‍රයේ ප්‍රශ්න 08, 10, 11, 12, 13, 23, සහ 26 සම්පූර්ණ කිරීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න. ( අයදුම්පත සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි කැපිටල් අකුරින් සම්පූර්ණ කරන්න. eg:- BANDARA )

08. නිශ්කාෂන සහතිකපත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන තානාපති කාර්යාලය අයත් රට සඳහන් කල යුතුය.

10. විදේශ රටවල තානාපති ලිපිනයන්ට, ආගමන විගමන පාලකවරයාට පමණක් නිශ්කාෂන සහතිකපත නිකුත් කරනු ලබන අතර පුද්ගලික ආයතන සඳහා නිශ්කාෂන සහතිකපත් නිකුත් නොකරන අතර දේශීය ආයතන සඳහා ප්‍රාදේශිය පොලිස්ථාන වලින් සහතිකපත ලබා ගැනීමට ක්‍රියා කල යුතුය.

11. ජාතික හැඳුනුම්පතෙහි නම සඳහන්ව ඇති ආකාරයටම නම සඳහන් කල යුතුය.

12. විදේශ ගමන් බලපත්‍රයේ නම සඳහන්ව ඇති ආකාරයටම සඳහන් කල යුතුය.

13. නිශ්කාෂන සහතිකපත මුද්‍රණය කල යුත්තේ විදේශ ගමන් බලපත්‍රයේ නමටද, ජාතික හැඳුනුම්පතෙහි නමටද යන්න පැහැදිලිව සඳහන් කල යුතුය. විදේශ ගමන් බලපත්‍රයේ නම වෙනස් කර ඇතිනම් එම වෙනස් කිරීමේ පිටුවෙහි පිටපතක් ද අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය. විදේශ ගමන් බලපත්‍රයේ නමට සහතිකපත ඉල්ලුම් කිරීමේදී විදේශ ගමන් බලපත්‍රයේ නම හා ජාතික හැඳුනුම්පතෙහි නම අතර වෙනසක් පවතින්නේ නම් ඒ සඳහා, නීතිඥවරයකු හෝ සාමදාන විනිසුරුවරයෙකු විසින් සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය. ( එම දිවුරුම් ප්‍රකාශය ලබාගත් දින සිට මාස 06ක කාලයක් සඳහා පමණක් වලංගු වේ. )

23. ශ්‍රී ලංකාවේ පදිංචිව සිටි කාලය පමණක් ඇතුළත් කල යුතුය. ( විදේශ ගතව සිටි කාලය හැර )

- පදිංචි කාලසීමාවන් නිවැරදිව සඳහන් කල යුතුය. ( දිනය/ මාසය/ වර්ෂය )
- පදිංචිව සිටි ලිපිනයන් හා පොලිස් වසම් නිවැරදිව සඳහන් කළ යුතුය.

ඉහත සඳහන් කරුණු නිවැරදිව ඇතුළත් කිරීම මගින් නිශ්කාෂන වාර්තාව නිකුත් කිරීම කාර්යාලීය දින 14ක් ඇතුලත සිදු කිරීමට උපකාරී වනු ඇත.

26. විමර්ෂණ කටයුතු සඳහා අයදුම්කරු සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා ශ්‍රී ලංකාව තුල භාවිතා කරන දුරකථන අංකයක් සඳහන් කල යුතුය.

## සැලකිය යුතුයි

- **නිශ්කාෂන අයදුම්පත් ඉදිරිපත් කල හැකි ආකාර**

I. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත ඕල්කට් මාවත, කොළඹ 11 ලිපිනයේ පිහිටි කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ බිම් මහලේ ස්ථාපිත කර ඇති නිශ්කාෂණ අයදුම්පත් භාර ගන්නා කාර්යාලයට භාර දිය හැකි අතර ඒ සඳහා මුදල් ගෙවීමද එම කාර්යාලය වෙත සිදු කල යුතුය. ( චෙක්පත් මගින් මුදල් ගෙවීම හා පොලිස්පති ගිණුමට මුදල් බැර කිරීම සිදු නොකල යුතුය. )

II. විදේශගතව සිටින අයදුම්කරුවන්, ඔවුන් විසින් සම්පූර්ණ කරන ලද අත්සන සහිත අයදුම්පතක් අයදුම්පතේ අංක 24 ට අනුව ඥාතියෙකු මගින් ඕල්කට් මාවත, කොළඹ 11 පිහිටි නිශ්කාෂන අයදුම්පත් භාර ගන්නා කාර්යාලයට භාර දිය හැකිය.

III. මාර්ගස්ථ නිශ්කාෂණ අයදුම් කිරීමේ ක්‍රමය ( Online ) මගින් නිශ්කාෂණ අයදුම්පත යොමු කිරීමේ හැකියාව ඇති අතර ඒ සඳහා මුදල් ගෙවීම Credit Card මගින් හා Debit Card මගින් සිදු කල හැකිය. ( www.police.lk / www.gov.lk )

IV. විදේශ තානාපති කාර්යාල හරහා ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් විසින් ජාතික හැඳුනුම්පතෙහි පිටපත් 02ක් හා විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් එවිය යුතු අතර, එසේ නොමැති අයදුම්පත් සඳහා නිශ්කාෂණ වාර්ථා නිකුත් නොකරන බව දන්වා සිටිමි.

V. ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයක් නොමැති විදේශ රටක සිට අයදුම්පතක් පොලිස්පති පොලිස් මුලස්ථානය වෙත යොමු කිරීමේදී ඊට අදාල රුපියල් 1500/= ක මුදල ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ පොලිස්පති ගිණුම් අංක 7041413 දරණ ගිණුමට බැර කර ඊට අදාල කුවිතාන්සිය අයදුම්පත සමග යොමු කල යුතුය.

- ඔබගේ අයදුම්පත්‍රය සමග පහත ලේඛණ ඉදිරිපත් කළ යුතුය.
  - I. අවසන් වරට නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හා එහි පැහැදිලි ජායා පිටපත් දෙකක්
  - II. වලංගු විදේශ ගමන් බලපත්‍රය හා එහි ජායා පිටපත් එකක් ( නම වෙනස් කර ඇත්නම් වෙනස් කිරීමේ පිටුවෙහි ජායා පිටපතක් ඉදිරිපත් කරන්න )

- අයදුම්පත විමර්ෂණය කිරීමේදී ප්‍රාදේශිය පොලිස් වාර්ථා නිර්දේශ නොකිරීම හා ජාතික හැඳුනුම්පත සම්බන්ධ ගැටළු ඇති වුවහොත් විද්‍යුත් තැපැල් මගින් අයදුම්කරු දැනුවත් කරන බැවින් නිවැරදි විද්‍යුත් තැපැල් ලිපිනයක් සඳහන් කල යුතුය.

- පොලිස් නිශ්කාෂන වාර්ථාව, ශ්‍රී ලංකා පොලිසිය විසින් ඔබ පිළිබඳව සිදු කරනු ලබන විමර්ෂණ මගින් ලබා ගන්නා පසු බිම් වාර්ථා මත පදනම්ව පොලිස් මුලස්ථානයේ මුලස්ථාන පරිපාලන අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලබන අතර අයදුම්කරු සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් යොමු කරන බව කරුණාවෙන් සලකන්න.

- විදේශිය අයදුම්කරුවකු නම් ලංකාවට පැමිණි සහ පිටව ගිය විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය නිවැරදිව සඳහන් කල යුතුය.

- පොලිස්, ත්‍රිවිධ හමුදා, සිවිල් ආරක්ෂක බලකාය, වෙරළ ආරක්ෂක බලකාය යන බලකායන්වල සක්‍රිය සේවයේ සිටින නිළධාරීන් හට පොලිස් නිශ්කාෂන වාර්ථා නිකුත් කරනු ලබන්නේ බලයලත් නිලධාරීන්ගේ ලිඛිත අවසරය මත පමණි.

- සහතිකය නිකුත් කල දිනය නැවත දීර්ඝ කර ගැනීම සඳහා අවශ්‍ය වූ විට ( Renewal ) අයදුම්පතක් සම්පූර්ණ කර මුල් සහතිකයේ ඇති තොරතුරු හා කාලසීමාව පමණක් ඇතුලත් කල යුතු අතර, තානාපති ලිපිනය හැර වෙනත් කිසිදු වෙනසක් සිදු නොකල යුතුය. ( සැ.යු:- නිශ්කාෂන සහතිකපත නිකුත් කල දින සිට වසරක් ඇතුලත අයදුම් කල යුතුය. )

- භාර දෙන ලද අයදුම්පත් සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමට අවශ්‍ය වූ විට පහත සඳහන් දුරකථන මගින් හෝ පොලිස් මුලස්ථානයේ පළමු මහලේ ඇති නිශ්කාෂන අංශයට පැමිණ විමසීම් කල හැකිය.


දුරකථන අංක - 011-2439185, 011-2421111

ෆැක්ස් අංක - 011-2439186, 011-2439187, 011-2439188

ඊමේල් අංක - clear@police.lk

වෙබ් ලිපිනය - www.police.lk